# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 506 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 23/03/2024<br>පැය 0540 |

# මාධ්‍ය නිවේදනය

**01. යතුරුපැදි සොරකමකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු හෙරොයින් සමඟ අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.03.12 වන දින මට්ටක්කුලිය පොලිස් වසමේ අලිවත්ත ප්‍රදේශයේ දී වෙඩි තබා පුද්ගලයෙකු ඝාතනය කිරීමට තැත් කිරීමේ සිද්ධියට අදාලව කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් විමර්ශනයක් ආරම්භ කර තිබූ අතර, ඉහත අපරාධය සඳහා පැමිණි යතුරු පැදිය 2024.02.27 වන දින වැල්ලම්පිටිය ප්‍රදේශයේදී සොරකම් කරන ලද යතුරු පැදියක් බවට අනාවරණය වී ඇත.

2024.03.22 වන දින උදෑසන කාලයේදී වැල්ලම්පිටිය පොලිස් වසමේ කටුපැලැල්ල හන්දියේදී මෙම යතුරු පැදිය සොරකම් කරන ලද සැකකරු **හෙරොයින් ග්‍රෑම් 05 මිලිගෑම් 720 ක්** සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 19 ක් වන කොච්චිකඩේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් අනාවරණය වූ තොරතුරු මත සඟවා තබන ලද **විදේශ රටක නිෂ්පාදිත ජීව අත්බෝම්බයක් සහ සොරකම් කරන ලද යතුරු පැදියේ රක්ෂණ සහතිකය** සොයා ගෙන ඇත. කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මත්ද්‍රව්‍ය සහ මත්පෙති සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.03.21 වන දින රාත්‍රී කාලයේදී දොඩංගොඩ පොලිස් වසමේ උඩවත්තගොඩ ප්‍රදේශයේදී කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 20 ක්, හැෂ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 140 මිලිග්‍රෑම් 800 ක්, මත් කරල් 293 ක් , මත් පෙති 05 ක් සහ ඉලෙක්ට්‍රොනික් තරාදියක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට** ගෙන දොඩංගොඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන දොඩංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු 2024.03.22 වන දින මතුගම ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව දින 07 ක රැඳවුම් නියෝග ලබාගෙන ඇත. දොඩංගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. කේරළ ගංජා සමඟ සැකකරුවකු අත්අඩංගුවට - කිලිනොච්චිය පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.

2024.03.22 වන දින සවස් කාලයේ කිලිනොච්චිය පොලිස් වසමේ උරුත්තිරපුරම් මාර්ගයේදී කිලිනොච්චිය පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරී ්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර සැකකටයුතු පුද්ගලයෙකු පරීක්ෂා කර **කේරළ ගංජා කිලෝ 07 ග්‍රෑම් 25 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කිලිනොච්චිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන කිලිනොච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කිලිනොච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.03.22 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ ඕඩියන් හන්දිය අසලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 500 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - රස්නායකපුර පොලිස් ස්ථානය.

2022.03.22 වන දින සවස් කාලයේදී රස්නායකපුර පොලිස් වසමේ කඩිගාව ප්‍රදේශයේදී අස්නායකපුර පොලිසිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරකට මත වැටලීමක් සිදුකර **මෙරට නිශ්පාදිත ගිනි අවියක්** සමඟ සැකකරුවෙකු අත් අඩංගුවට ගෙන ඇත.

**අත් අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වූ කඩිගාව, නිකවැරටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රස්නායකපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. ගඟේ පාවෙමින් තිබූ මෘත ශරීරයක් හමුවීම - නිවිතිගල පොලිස් වසම.

2024.03.22 වන දින උදෑසන කාලයේ නිවිතිගල පොලිස් වසමේ උඩ කරවිට ප්‍රදේශයේ කරවිට ගඟේ පුද්ගලයෙකුගේ මෘත ශරීරයක් ඇති බවට නිවිතිගල පොලීසියට ලද පණිවිඩයක් අනුව විමර්ශන ආරම්භ කර ඇත. සිදුකළ විමර්ශණයේදී මෙම පුද්ගලයාගේ බිරිඳ විසින් මෘත ශරීරය හඳුනාගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 72 ක් වන රුවන්සිරිපුර, උඩ කරවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු මානසික රෝගයෙන් හා අංශභාග රෝගයෙන් පෙළෙන පුද්ගලයෙකු වන අතර, ඔහු 2024.03.20 වන දින දහවල් කාලයේ ගඟෙන් එගොඩට යාමට ගොස් ඇති අතර, එම අවස්ථාවේදී ගඟට වැටී දියේ ගිලී ඇති බවට පොලිසිය සැකකරනු ලබයි. මෘත ශරීරය හදිසි මරණ පරීක්ෂණය සිදුකර රත්නපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. නිවිතිගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. ගඟේ පාවෙමින් තිබූ මෘත ශරීරයක් හමුවීම - වාලච්චේන පොලිස් වසම.

2024.03.22 වන දින උදෑසන කාලයේ වාලච්චේන පොලිස් වසමේ කිරාන් ප්‍රදේශයේ පුලිපංචිකල් ගඟේ පුද්ගලයෙකුගේ මෘත ශරීරයක් ඇති බවට වාලච්චේන පොලීසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත. සිදුකළ විමර්ශණයේදී මෙම පුද්ගලයාගේ බිරිඳ විසින් මෘත ශරීරය හඳුනාගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 40 ක් වන සින්නවෙම්බු, කිරාන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු 2024.03.20 වන දින කුඹුරට යන බව පවසා නිවසින් පිටව ගොස් ඇති අතර, මොහු අතුරුදහන්ව ඇති බවට බිරිඳ විසින් වාලච්චේන පොලිස් ස්ථානය පැමිණිල්ලක් ද කර ඇත. මෘත ශරීරය හදිසි මරණ පරීක්ෂණය සිදුකර වාලච්චේන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වාලච්චේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - මොරොන්තුඩුව පොලිස් වසම.

2024.03.22 වන දින අළුයම් කාලයේ මොරොන්තුඩුව පොලිස් වසමේ කළුතර බණ්ඩාරගම මාර්ගයේ දැල්කඩ ප්‍රදේශයේදී බණ්ඩාරගම දෙස සිට මොරොන්තුඩුව දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු බරපතල තුවාල ලබා බණ්ඩාරගම රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා හොරණ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 19 ක් වන අටළුගම, බණ්ඩාරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකර ඥාතීන්ට භාරදී ඇත. මොරොන්තුඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 09. මාරක රිය අනතුරක් - කිරින්ද පොලිස් වසම.

2024.03.22 වන දින සවස් කාලයේ කිරින්ද පොලිස් වසමේ තිස්සමහාරාමය කිරින්ද මාර්ගයේ විලමුල්ල හන්දිය අසලදී අතුරු මාර්ගයකින් පැමිණි යතුරු පැදියක් එක්වරම ප්‍රධාන මාර්ගයට පිවිසීමේදී පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන තාප්පයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු සහ පසු පැදිකරු බරපතල තුවාල ලබා දෙබරවැව රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී පැදිකරු මියගොස් ඇත. තුවාලකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා හම්බන්තොට රෝහලට මාරු කර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 40 ක් වන දකුණු රණකෙළිය, තිස්සමහාරාමය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දෙබරවැව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කිරින්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - පුත්තලම පොලිස් වසම.

2024.03.22 වන දින දහවල් කාලයේ පුත්තලම පොලිස් වසමේ පුත්තලම කුරුණෑගල මාර්ගයේ ගල්කුලම ප්‍රදේශයේදී කුරුණෑගල දෙස සිට පුත්තලම දෙසට ධාවනය වූ ලොරි රථයක් විරුද්ධ දිසාවෙන් පැමිණි යතුරුපැදියක ගැටී අතුරුව ලොරි රථය පෙරලීගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියේ පැදිකාරිය හා පිටුපස ගමන්ගත් කාන්තාවක් හා කුඩා ළමයෙකු තුවාල ලබා පුත්තලම රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකාරිය මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 47 ක් වන ආණමඩුව ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ලොරි රථ රියදුරු අනතුරින් තුවාල ලබා පුත්තලම රෝහලට ඇතුලත්ව ප්‍රතිකාර ලබයි. පුත්තලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - මාදම්පේ පොලිස් වසම.

2024.03.22 වන දින රාත්‍රී කාලයේ මාදම්පේ පොලිස් වසමේ පැලියගොඩ පුත්තලම මාර්ගයේ කිලෝ මීටර් 63 කණුව ආසන්නයේදී හලාවත දෙස සිට මාරවිල දෙසට ධාවනයවූ කාර් රථයක මාර්ගය හරහා ගමන්කළ පදික පුද්ගලයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික පුද්ගලයා බරපතල තුවාල ලබා හලාවත රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 54 ක් වන මැල්ලවාගාරය, මාදම්පේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හලාවත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මාදම්පේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - අතුරුගිරිය පොලිස් වසම.

2024.03.22 වන දින අළුයම් කාලයේ අතුරුගිරිය පොලිස් වසමේ පනාගොඩ ඇඹුල්ගම මාර්ගයේ පනාගොඩ හන්දිය ආසන්නයේදී පනාගොඩ දෙස සිට ඇඹුල්ගම දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගත

නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන තාප්පයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු බරපතල තුවාල ලබා හෝමාගම රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 53 ක් වන පනාගොඩ, හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**